# වාර්ෂික පර්යේෂණ සම්භාෂණය - 2025

## සිංහල අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය

## විස්තෘත සාරසංක්ෂේප මාර්ගෝපදේශ සංග්‍රහය

**පහත සඳහන් ආකෘතියට අනුව සකස් කළ යුතු ය.**

1. කෙටි සාරසංක්ෂේපය වචන 300කට නොවැඩි විය යුතු ය.
2. ප්‍රමුඛ පද පහක්
3. ප්‍රධාන පර්යේෂක සහ සම පර්යේෂකයන්ගේ නම්
4. ප්‍රධාන පර්යේෂක සහ සම පර්යේෂකයන්ගේ ආයතනික සම්බන්ධතා
5. පර්යේෂණ අරමුණු
6. පර්යේෂණ සම්භාෂණයේ තේමාවට ඇති අදාළත්වය
7. පර්යේෂණ ගැටලුව
8. දත්ත රැස් කිරීමේ ක්‍රම
9. දත්ත විශ්ලේෂණ විධික්‍රම
10. ප්‍රධාන නිගමන
11. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**සැලකිලිමත් විය යුතු කරුණු**

- සම්පූර්ණ විස්තෘත සාරසංක්ෂේපය වචන 1000කට නොවැඩි විය යුතු ය (වචන 300ක් වූ කෙටි සාරසංක්ෂේප ද සහිත ව).
- භාෂාව - සිංහල හෝ ඉංග්‍රීසි
- අකුරු මෝස්තර - සිංහල (FM Abhaya), ඉංග්‍රීසි (Time New Roman)
- අකුරුවල ප්‍රමාණය - සිංහල : මාතෘකාව 16 : අන්තර්ගතය 14
  ඉංග්‍රීසි : මාතෘකාව 14 : අන්තර්ගතය 12
- පේළි පරතරය - 1.5
- එක් පර්යේෂකයෙකුට/පර්යේෂක කණ්ඩායමකට ඉදිරිපත් කළ හැකි උපරිම විස්තෘත සාරසංක්ෂේප ප්‍රමාණය එකකි.
- සියලු ම විස්තෘත සාරසංක්ෂේප පර්යේෂණයේ තේමාවට අදාළ විය යුතු අතර එසේ නොවන ඒවා සමීක්ෂණ සඳහා ඉදිරිපත් නොකර ප්‍රතික්ෂේප කෙරෙයි.

- පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී උක්ත උපදෙස් සහ මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර එසේ නොකරන ලද විස්තෘත සාරසංක්ෂේප සංස්කාරක කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඔබ මෙවර පර්යේෂණ සම්භාෂණයට ඉදිරිපත් කරන විස්තෘත සාරසංක්ෂේපවලට අදාළ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා සම්භාෂණයෙන් අනතුරුව සංවිධායක මණ්ඩලය වෙත බාර දිය යුතු අතර විමර්ශන කටයුතු නිර්දේශ මත අනුමත පර්යේෂණ පත්‍රිකා සිංහල අධ්‍යයනාංශය මගින් ලබන වසරේ සංවිධානය කෙරෙන පර්යේෂණ සම්භාෂණයට සමගාමී ව ප්‍රකාශනයට පත් කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහයට අන්තර්ගත කෙරෙයි.
- ලියාපදිංචි ගාස්තුව රුපියල් 3000කි.
- සියලු ම විස්තෘත සාරසංක්ෂේප පහත සඳහන් විද්‍යුත් ලිපිනය ඔස්සේ Word සහ PDF යන දෙආකාරයෙන් ම එවිය යුතු ය.

**පර්යේෂණ පත්‍රිකා බාර ගැනීම**

- සාරසංක්ෂේප බාර ගන්නා අවසාන දිනය - 2025 ජූලි 09
- සාරසංක්ෂේප පිළිබඳ තීරණ දැනුම් දීම - 2025 අගෝස්තු 04
- සංශෝධිත සාරසංක්ෂේප බාර ගන්නා අවසාන දිනය - 2025 අගෝස්තු 18
- ඉදිරිපත් කිරීමට අදාළ ශ්‍රව්‍ය හා දෘශ්‍ය මෘදු පිටපත් ලබා ගැනීම - 2025 සැප්තැම්බර් 10
- පර්යේෂණ සම්භාෂණයේ සැසි පැවැත්වෙන දිනය - 2025 සැප්තැම්බර් 24

**විද්‍යුත් ලිපිනය -** ars@sinh.cmb.ac.lk

**සම සැසිප්‍රධානවරු**

මහාචාර්ය ලතා ගුරුසිංහ - 0779093999

ආචාර්ය දීපචන්දි අබේසිංහ - 0771765180